සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය - 2020

### 10 - ශ්‍රේණිය

### ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය -I, II

නම/විභාග අංකය : ............................................................... කාලය : පැය 03 යි.

## I පත්‍රය

උපදෙස් :

- සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- දී ඇති පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ' X' ලකුණ යොදන්න.
- එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40 කි.

01. මිනිස් අවශ්‍යතා පමණක් ඇතුළත් වන්නේ,

1. පොත්පත්, ආහාර, ඇඳුම්
2. සෞඛ්‍ය, ආහාර, ප්‍රවාහනය
3. බත්, කමිස, පෞද්ගලික පාසල්
4. අධ්‍යාපනය, පාන්, විනෝදාංශ

02. පොදුවේ ගත් කල ව්‍යාපාරයක අරමුණක් ලෙස සැලකිය හැක්කේ,

1. ලාභ ලබා ගැනීම.
2. අඩු මිලට භාණ්ඩ සැපයීම.
3. මිනිස් වුවමනා නිර්මාණය කිරීම.
4. වෙළෙඳපොළට භාණ්ඩ සැපයීම හා මිලදී ගැනීම.

03. පහත "X" තීරුවෙහි නිෂ්පාදන සාධක ද "Y"තීරුවෙහි ඊට අදාළ නිදසුන් ද දැක්වේ.

| X තීරුව | Y තීරුව |
|---|---|
| A. භූමිය | 1. ගණකාධිකාරී |
| B. ශ්‍රමය | 2. යන්ත්‍ර |
| C. ප්‍රාග්ධනය | 3. ව්‍යාපාර හිමිකරු |
| D. ව්‍යවසායකත්වය | 4. මිනිරන් |

"X" හා "Y" තීරුව ගැලපූ විට නිවැරදි පිළිතුරු කාණ්ඩය වන්නේ,

1. A-4, B-3, C-2, D-1
2. A-2, B-1, C-4, D-3
3. A-4, B-1, C-2, D-3
4. A-2, B-3, C-3, D-1

04. ව්‍යාපාරයක පාරිභෝගිකයෙකු ව්‍යාපාරයෙන් අපේක්ෂිත අරමුණක් වන්නේ,

1. ගුණාත්මක අමුද්‍රව්‍ය සැපයීමයි.
2. අඛණ්ඩව ඇනවුම් ලබා ගැනීමයි.
3. සාධාරණ වැටුපක් ලබා ගැනීමයි.
4. සාධාරණ මිලකට භාණ්ඩ මිලදී ගැනීමයි.

05. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධක පමණක් ඇතුළත් වන්නේ,

1. කළමනාකරුවන්, පාරිභෝගිකයන්, ණයදෙනුකරුවන්
2. අයිතිකරුවන්, කළමනාකරුවන්, සේවකයන්
3. සේවකයන්, කළමනාකරුවන්, ණයදෙනුකරුවන්
4. අයිතිකරුවන්, පාරිභෝගිකයන්, සේවකයන්

06. ශ්‍රී ලංකාවේ නව රජය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ නව ව්‍යාපෘතියකට චීනය සමඟ අත්සන් කරයි. මෙය අදාළ ව්‍යාපාර පරිසරය වන්නේ,

1. ආර්ථික පරිසරය
2. නීතිමය පරිසරය
3. දේශපාලන පරිසරය
4. ගෝලීය පරිසරය

07. ව්‍යාපාරයක ආර්ථික පරිසර සාධක පමණක් ඇතුළත් වන්නේ,

1. ආදායම් ව්‍යාප්තිය, උද්ධමනය, පොළී අනුපාතය
2. ආදායම් ව්‍යාප්තිය, නීතිරීති, සේවා නියුක්තිය
3. ඉතුරුම්, වයස් ව්‍යුහය, විරැකියා අනුපාතය
4. විදේශ විනිමය අනුපාතය, තාක්ෂණය, පොළී අනුපාතය

08. තාක්ෂණික පරිසරයේ ඇති වූ සංවර්ධනය තුළින් හටගත් නව ප්‍රවනතාවයක් වන්නේ මින් කුමක්ද?

1. ව්‍යාපාර සඳහා නව නීති හඳුන්වා දීම.
2. ආර්ථියේ පොදු මිල මට්ටම ඉහළ යාම.
3. නිපුණතා සහිත ශ්‍රමය විදේශ ගත කිරීම.
4. පෞද්ගලික රෝහල්වල වෛද්‍යවරු සඳහා මාර්ගගත චැනල් සේවය හඳුන්වා දීම.

09. විදේශීය වෙළෙඳපොළ සඳහා දේශීය භාණ්ඩ හා සේවා ශ්‍රමය හා ප්‍රාග්ධනය බාධාවකින් තොරව සැපයිය හැක්කේ,

1. ආර්ථික පරිසරයේ බලපෑමෙනි.
2. ගෝලීය පරිසරයේ බලපෑමෙනි.
3. තාක්ෂණික පරිසරයේ බලපෑමෙනි.
4. නීතිමය පරිසරයේ බලපෑමෙනි.

10. ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමෙන් හඳුනාගත හැකි ශක්තියක් හා අවස්ථාවක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද?

1. ප්‍රමාණවත් ප්‍රාග්ධනය හා සන්නම් නාමයක් තිබීම.
2. කළමනාකරුවන්ගේ පළපුරුද්ද හා නව තරඟකරුවන් බිහි වීම.
3. සේවකයන්ගේ දැනුමෙහි නිපුණතාවය හා කැපවීම සහ වරාය නගරය බිහි වීම.
4. සුවිශේෂී නිෂ්පාදන ක්‍රම හා සන්නම් නාමයක් පැවරීම.

11. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධානය වර්ග කිරීමේ දී යොදා ගනු ලබන නිර්ණායකයන් වන්නේ,

1. භාවිතා කල බලශක්තියයි.
2. ව්‍යාපාරයේ ලාභ අරමුණයි.
3. ව්‍යාපාරවල පොදු අයිතියයි.
4. ව්‍යාපාරයේ කළමනාකරණයේ ස්වභාවය

12. පහත "X" තීරුවෙහි දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධාන වර්ග හා "Y" තීරුවෙහි දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධානවල වාසි කිහිපයකි.

| X තීරුව | Y තීරුව |
|---|---|
| A. හවුල් ව්‍යාපාර | 1. තම දක්ෂතා උපරිමයෙන් භාවිතා කිරීම. |
| B. කේවල ස්වාමී ව්‍යාපාර | 2. විශාල ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකි වීම. |
| C. සංස්ථාපිත සමාගම් | 3. පෞද්ගලික අංශයේ වෙළෙඳපොළ ඒකාධිකාරය අඩු කිරීම. |
| D. රාජ්‍ය සංස්ථා | 4. වගකීම බෙදී යාම. |

"X" හා "Y" තීරුව ගැලපූ විට නිවැරදි පිළිතුරු කාණ්ඩය වන්නේ,

1. A-4, B-3, C-2, D-1
2. A-1, B-2, C-4, D-3
3. A-3, B-1, C-3, D-2
4. A-4, B-1, C-2, D-3

13. සමූපකාර සමිතියක පමණක් දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

1. ලාභය අරමුණු කර ගැනීමයි.
2. විශාල ප්‍රාග්ධනයක් රැස් කර ගැනීමයි.
3. ප්‍රජාතන්ත්‍රවදී පාලනයක් තිබීමයි.
4. ස්වාධීන තීරණ ගැනීමේ හැකියාවයි.

14. තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් ලබා ගත හැකි වාසියක් වන්නේ මින් කුමක්ද?

1. අඛණ්ඩ පැවැත්මක් ලැබීම.
2. ව්‍යාපාරයට අනන්‍යතාවයක් ලැබීම.
3. වගකීම සීමා සහිත වීම.
4. නීතිමය පුද්ගලභාවයක් ලැබීම.

15. හිමිකාරීත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේදී පෞද්ගලික අංශයට හිමි ව්‍යාපාර සංවිධාන පමණක් ඇතුළත් වන්නේ කුමක්ද?

1. හවුල් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම්, සමූපකාර සමිති
2. කේවල ස්වාමී ව්‍යාපාර, රාජ්‍ය සමාගම්, සමූපකාර සමිති
3. සංස්ථාපිත සමාගම්, රාජ්‍ය සමාගම්, රාජ්‍ය සංස්ථා
4. සමිති, දෙපාර්තමේන්තු, සංස්ථාපිත සමාගම්

16. ගිණුම්කරණයෙහි ප්‍රධාන අරමුණ වන්නේ කුමක්ද?

1. ලාභය උපරිම කිරීම.
2. ඇල්මැති පාර්ශවයන්ට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීම.
3. පාරිභෝගික තෘප්තිය උපරිම කිරීම.
4. භාණ්ඩ හා සේවා සැපයීම.

17. ජංගම වගකීම් පමණක් ඇතුළත් වරණය වනුයේ,

1. බැංකු ණය, බැංකු අයිරාව, ගෙවිය යුතු ණය පොළී
2. ණයහිමි, බැංකු අයිරාව, ගැනිලි
3. බැංකු අයිරාව, ණයහිමි, ගෙවිය යුතු විදුලිය
4. ගෙවිය යුතු දුරකථන, ණයහිමි, බැංකු ණය

18. අතීත ප්‍රතිඵලයක් ලෙස බිහි වන අනාගත ආර්ථික ප්‍රතිලාභ බිහි කරන ව්‍යාපාරයේ පාලනයට යටත් වටිනාකම් වන්නේ,

1. ව්‍යාපාර ගණුදෙනුය.
2. වගකීම්ය.
3. ව්‍යාපාර හිමිකම්ය.
4. වත්කම්ය.

19. ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණයෙහි වත්කම් වැඩි වීම හා වත්කම් අඩු වීම යන බලපෑම සිදු කරන ගණුදෙනුව වන්නේ,

1. රු. 20 000 ක භාණ්ඩ තොගයක් මිලදී ගැනීමයි.
2. රු. 15 000 ක බැංකු ණය ගෙවීමයි.
3. රු. 25 000 ක භාණ්ඩ ණයට ලබා ගැනීමයි.
4. රු. 5 000 ක ප්‍රචාරණ වියදම් දැරීමයි.

20. ව්‍යාපාර හිමිකම වෙනස් වීමට බලනොපාන සංරචකය කුමක්ද?

1. ආදායම්
2. ගැනිලි
3. බැංකු ණය
4. අතිරේක ප්‍රාග්ධනය

21. "ව්‍යාපාරයක් රු. 10 000 ක බැංකු ණය හා රු. 1 000 ක ණය පොළී ගෙවීම" මින් ගිණුම්කරණ සමීකරණයට සිදුවන බලපෑම වන්නේ,

1. වත්කම් අඩු වේ, හිමිකම වැඩි වේ, වගකීම අඩු වේ.
2. වත්කම් අඩු වේ, හිමිකම අඩු වේ, වගකීම අඩු වේ.
3. වත්කම් අඩු වේ, හිමිකම වෙනස් නොවේ, වගකීම අඩු වේ.
4. වත්කම් අඩු වේ, හිමිකම අඩු වේ, වගකීම වෙනස් නොවේ.

22. "වැඩි වීම බැර, අඩු වීම හර" යන ද්විත්ව සටහන් මූලධර්මයට අදාළ ගිණුම් වර්ග වන්නේ,

1. වත්කම් හා වගකීම් ගිණුමය.
2. ආදායම් හා වත්කම් ගිණුම්ය.
3. හිමිකම් හා වියදම් ගිණුම්ය.
4. ආදායම් හා වගකීම් ගිණුම්ය.

23. "X"තීරුවෙහි මූලික පොත් ද "Y"තීරුවෙහි මූලාශ්‍ර ලේඛණ ද දැක්වේ.

| X තීරුව | Y තීරුව |
|---|---|
| A. මුදල් පොත | 1. ගැනුම් ඉන්වොයිසිය |
| B. ගැනුම් ජ'නලය | 2. ජ'නල් වවුචරය |
| C. පොදු ජ'නලය | 3. බැංකු තැන්පතු පත්‍රය, බැංකු ප්‍රකාශය |
| D. බැංකු ගිණුම | 4. ලදුපත හා ගෙවීම් වවුචරය |

"X" හා "Y" තීරුව නිවැරදිව ගැලපූ විට පිළිතුරු වන්නේ,

1. A-4, B-1, C-2, D-3
2. A-4, B-2, C-1, D-3
3. A-2, B-1, C-4, D-3
4. A-3, B-1, C-4, D-2

24. ව්‍යාපාරය දුන් වට්ටම්වලට අදාළ ද්විත්ව සටහන වන්නේ කුමක්ද?

1. දුන් වට්ටම් හර
   ණයහිමි බැර
2. දුන් වට්ටම් හර
   මුදල් පොත බැර
3. දුන් වට්ටම් හර
   ණයගැති බැර
4. දුන් වට්ටම් හර
   හිමිකම් ගිණුම බැර

25. කසුන්ගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රීමය රු. 4 000 කි. 2020.01.31 දිනට සුළු මුදල් වියදම්වල එකතුව රු.3 200 කි. 2020.02.01 දින සුළු මුදල් අග්‍රීමය තවත් රු. 1 000 කින් වැඩි කිරීමට තීරණය කරන ලද්දේ නම් 2020.02.01 දිනට අග්‍රීමය ප්‍රතිපූර්ණය කළ මුදල වන්නේ,

1. රු. 3 200 කි.
2. රු. 4 200 කි.
3. රු. 5 000 කි.
4. රු. 1 800 කි.

26. ව්‍යාපාරයකක තැන්පත් කළ චෙක්පතක් අගරු වූ විට ද්විත්ව සටහන වන්නේ කුමක්ද?

1. බැංකු ගිණුම හර
   ණයගැති ගිණුම බැර
2. ණයහිමි ගිණුම හර
   බැංකු ගිණුම බැර
3. ණයගැති ගිණුම හර
   මුදල් පොත බැර
4. ණයගැති ගිණුම හර
   බැංකු ගිණුම බැර

- පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 27 සහ 28 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ව්‍යාපාරයක 2020.03.31 දිනට බැංකු ගිණුමේ හර ශේෂය රු.20 000 කි. බැංකුවට සෘජුවම ලැබී ඇති ණයගැති ප්‍රේෂණ රු. 10 000 කි. බැංකුව ස්ථාවර නියෝග මත ගෙවීම් රු. 5 000 කි. නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් රු. 8 000 කි.

27. 2020.03.31 දිනට සංශෝධන බැංකු ගිණුමේ ශේෂය වනුයේ,

1. රු. 30 000 කි.
2. රු. 25 000 කි.
3. රු. 15 000 කි.
4. රු. 33 000 කි.

28. 2020.03.31 දිනට බැංකු ප්‍රකාශයේ ශේෂය වනුයේ,

1. රු. 33 000 කි.
2. රු. 25 000 කි.
3. රු. 17 000 කි.
4. රු. 23 000 කි.

29. පොදු ජ'නලයේ සටහන් කරන ගණුදෙනුව කුමක්ද?

1. වෙළෙඳ භාණ්ඩ ණයට ගැනීම.
2. රු. 20 000 ක යන්ත්‍රයක් මිලදී ගැනීම.
3. වෙළෙඳ භාණ්ඩ ණයට විකිණීම.
4. ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා යන්ත්‍රයක් ණයට ගැනීම.

30. පරිගණකගත ගිණුම්කරණයෙහි අවාසියක් වන්නේ,

1. අවශ්‍ය දත්ත ඉක්මනින් ලබා ගැනීමේ හැකියාවයි.
2. ගිණුම් තොරතුරු වල නිවැරදිතාවය වැඩි වීමයි.
3. තොරතුරු විනාශ වීමේ අවධානමක් පැවතීමයි.
4. ගිණුම් වාර්තා ස්වයංක්‍රීයව සකස් වීමයි.

31. ශේෂ පිරික්සුම සකස් කිරීමේ මූලික අරමුණ කුමක්ද?

1. ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය ගණනය කිරීම.
2. ගිණුම් සකස් කිරීමේ ගණිතමය නිවැරදිතාවය තහවුරු කිරීම.
3. ව්‍යාපාරයේ හිමිකම ගණනය කිරීම.
4. ද්විත්ව සටහන් ක්‍රමයේ නිවැරදිතාවය තහවුරු කිරීම.

32. රු. 50 000 ක ගැනුම් ඉන්වොයිසියක් ගැනුම් ජ'නලයේ රු. 5 000 ක් ලෙස සටහන් වීම නිවැරදි කිරීමේ ද්විත්ව සටහන වන්නේ,

1. ගැනුම් ගිණුම හර 45 000
   ණයහිමි ගිණුම බැර 45 000
2. ගැනුම් ගිණුම හර 50 000
   ණයහිමි ගිණුම බැර 50 000
3. ණයහිමි ගිණුම හර 45 000
   ගැනුම් ගිනුම බැර 45 000
4. ගැනුම් ගිණුම හර 50 000
   මුදල් පොත බැර 50 000

33. ශේෂ පිරික්සුම තුළින් අනාවරණය වන ගිණුම්කරණ දෝෂය වන්නේ,

1. රු. 25 000 විකුණුම් ඉන්වොයිසියක් පොත් වලින් මඟ හැරීම.
2. රු. 5 000 ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම්, ගැනුම් ගිණුමට හර කර තිබීම.
3. රු. 3 000 ක දුරකථන ගෙවීම් මුදල් පොතේ පමණක් සටහන් කිරීම.
4. රු 4 000 ප්‍රචාරණ වියදම් එම ගිණුම්වල දෙවරක් සටහන් වීම.

34. රු. 10 000 ක සේවක වැටුප් ගෙවීම එම ගිණුම්වල දෙවරක් සටහන් වීම නිවැරදි කිරීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,

1. සේවක වැටුප් හර 10 000
   මුදල් පොත බැර 10 000
2. සේවක වැටුප් හර 20 000
   මුදල් පොත බැර 20 000
3. මුදල් පොත හර 20 000
   සේවක වැටුප් බැර 20 000
4. මුදල් පොත හර 10 000
   සේවක වැටුප් බැර 10 000

- ව්‍යාපාරයක 2020.03.31 දිනට පැවති පහත තොරතුරු උපයෝගී කර ගෙන ප්‍රශ්න අංක 35 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි | රු. 150 000 | ණයහිමි | රු. 20 000 |
| යන්ත්‍ර | රු. 50 000 | බැංකු ණය | රු. 150 000 |
| මෝටර් රථ | රු. 200 000 | බැංකු අයිරාව | රු. 30 000 |
| ණයගැති | රු. 30 000 | ණය පොළී | රු. 5 000 |
| මුදල් ශේෂය | රු. 20 000 | සේවක වැටුප් | රු. 10 000 |
| බැංකු ශේෂය | රු. 50 000 | විදුලිය | රු. 3 000 |
| තොගය | රු. 25 000 | ගැනුම් | රු. 50 000 |
| විකුණුම් | රු. 125 000 | ගොඩනැගිලි කුලී | රු. 2 000 |
| ලද කොමිස් | රු. 5 000 | දුරකථන | රු. 1 500 |
| ලද වට්ටම් | රු. 5 000 | ප්‍රචාරණ | රු. 2 500 |

35. 2020.03.31 දිනට ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම්වල වටිනාකම වනුයේ,

| | | | |
|---|---|---|---|
| 1. | රු. 400 000 කි. | 2. | රු. 525 000 කි. |
| 3. | රු. 650 000 කි. | 4. | රු. 660 000 කි. |

36. 2020.03.31 දිනට ව්‍යාපාරයේ ජංගම වත්කම්වල වටිනාකම වනුයේ,

| | | | |
|---|---|---|---|
| 1. | රු. 260 000 කි. | 2. | රු. 125 000 කි. |
| 3. | රු. 175 000 කි. | 4. | රු. 525 000 කි. |

37. 2020.03.31 දිනට ව්‍යාපාරයේ ජංගම නොවන වගකීම්වල වටිනාකම වනුයේ,

| | | | |
|---|---|---|---|
| 1. | රු. 180 000 කි. | 2. | රු. 200 000 කි. |
| 3. | රු. 185 000 කි. | 4. | රු. 150 000 කි. |

38. 2020.03.31 දිනට ව්‍යාපාරයේ ජංගම වගකීම්වල වටිනාකම වනුයේ,

| | | | |
|---|---|---|---|
| 1. | රු. 20 000 කි. | 2. | රු. 30 000 කි. |
| 3. | රු. 50 000 කි. | 4. | රු. 200 000 කි. |

39. 2020.03.31 දිනට ව්‍යාපාරයේ මුළු ආදායම වනුයේ,

| | | | |
|---|---|---|---|
| 1. | රු. 135 000 කි. | 2. | රු. 125 000 කි. |
| 3. | රු. 137 000 කි. | 4. | රු. 10 000 කි. |

40. 2020.03.31 දිනට ව්‍යාපාරයේ මුළු වියදම වනුයේ,

| | | | |
|---|---|---|---|
| 1. | රු. 24 000 කි. | 2. | රු. 74 000 කි. |
| 3. | රු. 69 000 කි. | 4. | රු. 72 000 කි. |

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය - 2020

### 10 - ශ්‍රේණිය

### ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

නම/විභාග අංකය : ..........................................................................

## II පත්‍රය

**උපදෙස් :**

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වෘත්තීය පුහුණු ආයතනයේ අත්කම් නිර්මාණ පිළිබඳ පාඨමාලාවක් හැදෑරූ සමාධි රු. 75 000 ක තම ඉතුරුම් භාවිතා කරමින් "සමාධි අත්කම්" නමින් 2020.01.01 දින ව්‍යාපාරයක් සංචාරක ආකර්ශනය ඇති ප්‍රදේශයක ආරම්භ කරන ලදි. ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම සඳහා සමාධි 2020.01.01 දින අඩු පොලී අනුපාතයකට රු. 200 000 ක බැංකු ණයක් ලබා ගත් අතර අත්කම් නිර්මාණ පිළිබඳව පළපුරුද්දක් සහිත සේවිකාවක් ද මසකට රු. 15 000 ක වැටුපකට බඳවා ගන්නා ලදි. ජනවාරි මාසය තුල සිදු වූ අනෙකුත් ගණුදෙනු පහත දැක්වේ.

| | |
|---|---|
| ගැනුම් | රු. 75 000 |
| කුඩා යන්ත්‍රයක් මිලදී ගැනීම | රු. 15 000 |
| විකුණුම් | රු. 150 000 |
| සේවක වැටුප් | රු. 15 000 |
| ප්‍රවාහන වියදම් | රු. 2 000 |
| ගොඩනැගිලි කුලී | රු. 5 000 |
| කොමිස් ආදායම් | රු. 15 000 |

i. (අ) සමාධි විසින් ආරම්භ කරන ලද ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?
   (ආ) එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසි දෙකක් ලියන්න.

ii. සමාධිගේ ව්‍යාපාරය ලියාපදිංචි කල යුතු ද ඒ සඳහා හේතු දක්වන්න.

iii. සමාධිගේ ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තීන් දෙකක් ලියා දක්වන්න.

iv. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි අවස්ථා දෙකක් ලියන්න.

v. 2020.01.01 දිනට අදාළව ගිණුම්කරණ සමීකරණය ලියා දක්වන්න.

vi. සමාධිගේ ව්‍යාපාරයේ දැකිය හැකි ජංගම නොවන වගකීමක් සහ ජංගම වත්කමක් ලියා දක්වන්න.

vii. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි වියදම් දෙකක් වටිනාකම් සහිතව ලියා දක්වන්න.

viii. සමාධි තම ව්‍යාපාරය සඳහා යොදාගත් ප්‍රාග්ධන සම්පාදන මාර්ග දෙක ලියා දක්වන්න.

ix. මෙම ව්‍යාපාරයේ මුදල් පොතෙහි හරට සටහන් කරන අයිතම දෙකක් වටිනාකම් සහිතව ලියන්න.

x. (අ) සමාධි තම මිතුරියක වන තරු මෙම ව්‍යාපාරයට සම්බන්ධ කර ගැනීමට අදහස් කරයි නම් ඇයට පහසුවෙන්ම ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?
   (ආ) එම ව්‍යාපාරයේ ඇති අවාසි දෙකක් ලියන්න. **(ලකුණු 2x10=20)**

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

**(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)**

02. i. වර්තමාන සමාජය තුළ මිනිස් වුවමනාවන් දිනෙන් දින වර්ධනය වේ. වුවමනා වල දැකිය හැකි වෙනත් ලක්ෂණ දෙකක් ලියන්න.

ii. භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට අදාළ පහත අයිතම සඳහා නිෂ්පාදන සාධක හතර ලියා දක්වන්න.

A - කළමනාකරු B - වනාන්තර

C - ගොඩනැගිලි D - අවධානම් දැරීම

iii. වර්තමානයේ බොහෝ ව්‍යාපාර වඩාත් කාර්යක්ෂම ලෙස පාරිභෝගික සේවා සපයයි. සේවා සපයන ව්‍යාපාර දෙකක් දක්වන්න.

iv. ව්‍යාපාරයක සේවකයන් හා රජය ව්‍යාපාරයෙන් අපේක්ෂිත අරමුණු දෙක බැගින් ලියන්න.

**(ලකුණු 2x4=08)**

03. i. "සාර්ථකව ව්‍යාපාර කටයුතු සිදු කිරීමට ව්‍යාපාර පරිසරය අධ්‍යනය කිරීම වැදගත් වේ." මෙලෙස ව්‍යාපාර පරිසරය තුළින් හඳුනා ගන්නා ප්‍රධාන සංරචක හතර මොනවාද?

ii. පහත අයිතමයන් අයත් ව්‍යාපාර පරිසර සාධක නම් කරන්න.

(අ) රජය විසින් පොල් සඳහා පාලන මිලක් නියම කිරීම.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු ණය සඳහා පොළී අනුපාත පහත දැමීම.

(ඇ) මාර්ගගත ඉගෙනුම් සඳහා වඩාත් කාර්යක්ෂම මෘදුකාංගයක් හඳුන්වා දීම.

(ඉ) ලෝක වෙළෙඳපොළෙහි රත්‍රං මිල සීග්‍රයෙන් ඉහළ යාම.

iii. රජය විසින් පනවන නීතිරීති ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක වන බලයලත් ආයතන දෙකක් දක්වන්න.

iv. තාක්ෂණික පරිසරයේ සිදුවන සීග්‍ර වර්ධනය නිසා ව්‍යාපාරවල හටගත් නව ප්‍රවනතා හතරක් ලියා දක්වන්න.

**(ලකුණු 2x4=08)**

04. i. "ව්‍යාපාර ලෝකයේ විවිධ ව්‍යාපාර සංවිධාන දැකිය හැකිය." අරමුණ මත ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ ගැලීම් සටහන අඳින්න.

ii. පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී සේවක සංඛ්‍යාව එක් නිර්ණායකයකි.

(ආ) හවුල් ව්‍යාපාර ආඥා පනතට අනුව එහි හවුල්කරුවන් සංඛ්‍යාව දෙකකි.

(ඇ) විවෘත හා ස්වේච්ඡා සාමාජිකත්වය සමුපාකාර සමිතියක එක් ලක්ෂණයකි.

(ඈ) තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් නීතිමය පුද්ගලභාවයක් හිමි වේ.

iii. සංස්ථාපිත සමාගමක දැකිය හැකි වාසියක් හා අවාසියක් ලියන්න.

iv. පහත ව්‍යාපාර අයත් ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කරන්න.

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය

(ආ) අමිත් ස්ටෝර්ස්

(ඇ) සපුමල් හා පුත්‍රයෝ

(ඈ) සීමා සහිත ගුණවංශ සමාගම **(ලකුණු 2x4=08)**

## II කොටස - ගිණුම්කරණය

**(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)**

05. i. ගිණුම්කරණය යනු කුමක් දැයි හඳුන්වා එහි අරමුණු දෙකක් ලියා දක්වන්න. **(ලකුණු 02)**

ii. ව්‍යාපාරයක ඇතිවන ගණුදෙනුවලට අමතරව සිද්ධි දෙකක් සඳහා උදාහරණ දෙකක් සපයන්න. **(ලකුණු 02)**

iii. පහත දැක්වෙන්නේ සුපුනිගේ ව්‍යාපාරයේ 2020.01.01 දින ඇති වූ ගණුදෙනු කිහිපයකි. එහි ආරම්භක ගිණුම්කරණය ඔබට සපයා ඇත.

වත්කම් = හිමිකම් + වගකීම්

250 000 = 200 000 + 50 000 (බැංකු ණය)

(අ) රු. 20 000 ක භාණ්ඩ මිලදී ගැනීම.

(ආ) රු. 5 000 ක භාණ්ඩ රු. 6 500 කට විකිණීම.

(ඉ) රු. 3 000 ක විදුලි බිල ගෙවීම.

(ඊ) රු. 10 000 ක බැංකු ණය ගෙවීම.

අවශ්‍ය වන්නේ,
මෙම ගණුදෙනු ගිණුම්කරණ සමීකරණයෙහි දක්වන්න. **(ලකුණු 04)**

iv. පහත දී ඇති ගිණුම්වලට අදාළ වැඩි වීම හෝ අඩු වීම සටහන් කරන ආකාරය දක්වන්න.

| ගිණුම | වැඩි වීම | අඩු වීම |
|---|---|---|
| (1) විකුණුම් ගිණුම | | |
| (2) යන්ත්‍ර ගිණුම | | |
| (3) ප්‍රාග්ධන ගිණුම | | |
| (4) ලිපිද්‍රව්‍ය ගිණුම | | |

**(ලකුණු 04)**
**(මුළු ලකුණු 12)**

06. i. ගිණුම්කරණයේ දී මුදල් පොත ද්විත්ව කාර්යයක් ඉටු කරයි. ඒ කවරේද? **(ලකුණු 02)**

ii. සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය යනු කුමක්ද? **(ලකුණු 02)**

iii. පහත දැක්වෙන්නේ ධනුකගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයේ තොරතුරුය.

| දිනය | ලදුපත් අංකය | වවුචර් අංකය | විස්තරය |
|---|---|---|---|
| 2020.01.01 | 01 | | රු. 75 000 ක් ආයෝජනය කර ව්‍යාපාරය ආරම්භ කිරීම. |
| 2020.01.02 | | 01 | රු. 25 000 ක් වටිනා භාණ්ඩ මිලදී ගැනීම. |
| 2020.01.04 | 02 | | රු. 20 000 ක භාණ්ඩ විකිණීම. |
| 2020.01.06 | | 02 | රු. 30 000 ක ගොඩනැගිලි කුලී ගෙවීම. |
| 2020.01.08 | 03 | | රු. 10 000 ක කොමිස් ආදායමක් ලැබීම. |
| 2020.01.13 | 04 | | රු. 50 000 ක බැංකු ණයක් ලබා ගැනීම. |
| 2020.01.15 | | 03 | රු. 8 000 ක යන්ත්‍රයක් ලබා ගැනීම. |
| 2020.01.25 | | 04 | රු. 5 000 ක බැංකු ණය වාරිකය ගෙවීම. |

අවශ්‍ය වන්නේ,
ඔබ විසින් 2020.01.31 දිනට මුදල් පොත සකස් කර තුලනය කරන්න. **(ලකුණු 04)**

iv. පහත දැක්වෙන්නේ වෙනුකගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයේ සිදු වූ ගණුදෙනු කිහිපයකි. ඊට අදාළව වගුව පුරවන්න.

| ගණුදෙනුවේ ස්වාභවය | මූලාශ්‍ර ලේඛණය | මූලික පොත |
|---|---|---|
| (1) මුදල් ලැබීම් හා ගෙවීම් | | |
| (2) චෙක්පත් වලින් ගෙවීම් | | |
| (3) වෙළෙඳ භාණ්ඩ ණයට ගැනීම් | | |
| (4) වෙළෙඳ භාණ්ඩ ණයට විකිණීම | | |

**(ලකුණු 04)**
**(මුළු ලකුණු 12)**

07\. i. 2020 ජනවාරි 31 දිනට නදීකගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ හර ශේෂය රු. 25 000 කි. එදිනට බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශයේ ශේෂය ඊට වෙනස් විය. මෙම වෙනසට හේතු පහත වේ.

- ජනවාරි මාසයේ බංකුවේ තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම රු. 28 000 කි.
- බැංකුව විසින් අයකර ඇති  බැංකු ගාස්තු රු. 3 000 කි.
- ව්‍යාපාරය විසින් නිකුත් කර ඇති නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්වල වටිනාකම රු. 20 000 කි.
- බැංකුවට සෘජුවම ලැබී ඇති ණයගැති සෘජු ප්‍රේෂණ රු. 15 000 කි.

අවශ්‍ය වන්නේ,

(අ) 2020.01.31 දිනට සංශෝධිත බැංකු ගිණුම **(ලකුණු 02)**

(ආ) 2020.01.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ්‍ය **(ලකුණු 04)**

ii. පහත දැක්වෙන්නේ පබාගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයේ වෙළෙඳ භාණ්ඩ ණයට ගැනුම් පිළිබඳ තොරතුරුය.

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | ශුද්ධ වටිනාකම |
|---|---|---|---|
| 2020.01.05 | 85 | ගයාන් | රු. 25 000 |
| 2020.01.15 | 112 | සම්පත් | රු. 37 000 |

අවශ්‍ය වන්නේ,

2020.01.31 දිනට ගැනුම් ජ'නලය **(ලකුණු 02)**

iii. 2020.03.31 දිනට අමාගේ සිල්ලර ව්‍යාපාරයේ පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම තුලනය නොවූයෙන් එහි වෙනස වූ රු. 10 000 අවිනිශ්චිත ගිණුමට හර කරන ලදි. පසුව පහත වැරදි අනාවරණය කර ගන්නා ලදි.

1) රු. 2 000 ක දුරකථන වියදම් ගෙවීම් මුදල් පොතේ පමණක් සටහන් කර ඇත.

2) රු. 10 000 ක විකුණුම් ඉන්වොයිසියක් පොත් වලින් සම්පූර්ණයෙන්ම මඟ හැරී ඇත.

3) රු. 5 000 ක යන්ත්‍රයක් මිලදී ගැනීම, ගැනුම් ගිණුමට හර කර ඇත.

4) රු. 8 800 ක සේවක වැටුප් ගෙවීම, එම ගිණුමෙහි සටහන් කර ඇත්තේ රු. 800 ක් ලෙසය.

අවශ්‍ය වන්නේ,

(අ) වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන් **(ලකුණු 02)**

(ආ) අවිනිශ්චිත ගිණුම **(ලකුණු 02)**

**(මුළු ලකුණු 12)**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය - 2020

### ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

### 10 ශ්‍රේණිය - පිළිතුරු

### I - පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | **2** | 11 | **1** | 21 | **2** | 31 | **2** |
| 02 | **1** | 12 | **4** | 22 | **4** | 32 | **1** |
| 03 | **3** | 13 | **3** | 23 | **1** | 33 | **3** |
| 04 | **4** | 14 | **2** | 24 | **3** | 34 | **4** |
| 05 | **2** | 15 | **1** | 25 | **2** | 35 | **1** |
| 06 | **3** | 16 | **2** | 26 | **4** | 36 | **2** |
| 07 | **1** | 17 | **3** | 27 | **2** | 37 | **4** |
| 08 | **4** | 18 | **4** | 28 | **1** | 38 | **3** |
| 09 | **2** | 19 | **1** | 29 | **4** | 39 | **1** |
| 10 | **3** | 20 | **3** | 30 | **3** | 40 | **2** |

**(ලකුණු 1x40=40)**

### II - පත්‍රය

01. i. (අ) තනි පුද්ගල ව්‍යාපාරයකි / කේවල ස්වාමි ව්‍යාපාරයකි

(ආ) 1. පහසුවෙන් ආරම්භ කළ හැකි වීම.
2. ලාභය තනිව භුක්ති විඳිය හැකි වීම.
3. කැපවීම මත දියුණු කර ගත හැකිය.

ii. ලියාපදිංචි කළ යුතුය.
තමාගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් ආරම්භ කරන නිසා

iii. 1. සමාධිගේ අත්කම් පිළිබඳ දැනුම හා කුසලතාවය. (පාඨමාලාව හැදෑරීම නිසා)
2. පළපුරුදු සේවිකාවක් බඳවා ගැනීම.

iv. 1. සංචාරක ආකර්ශණීය ප්‍රදේශයක පිහිටා තිබීම.
2. අඩු පොළියට ණය ලබා ගැනීම.

v. වත්කම් = හිමිකම් + වගකීම්
275 000 = 75 000 + 200 000

vi. ජංගම නොවන වගකීම් - බැංකු ණය
ජංගම වත්කම් - මුදල්

vii. 1. සේවක වැටුප් 2. ප්‍රවාහන වියදම් 3. ගොඩනැගිලි කුලී

viii. ඉතුරුම් හා බැංකු ණය

ix.

| | |
|---|---|
| ප්‍රාග්ධනය | රු. 75 000 |
| බැංකු ණය | රු. 200 000 |
| විකුණුම් | රු. 150 000 |
| කොමිස් ආදායම | රු. 15 000 |

x. (අ) හවුල් ව්‍යාපාර

(ආ) 1. ලාභය බෙදී යාම
2. මත ගැටුම් ඇති විය හැකි වීම
3. අසීමිත වගකීම
4. නීතිමය පුද්ගලභාවය රහිත වීම

**(ලකුණු 2x10=20)**

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. i.
1. අත්‍යවශ්‍ය නොවීම.
2. සංකීර්ණ වීම.
3. විවිධ වීම. **(ලකුණු 02)**

ii. A - ශ්‍රමය B - භූමිය
C - ගොඩනැගිලි D - ව්‍යවසායකත්වය **(ලකුණු 02)**

iii.
1. තොග වෙළෙඳ ආයතන
2. සිල්ලර වෙළෙඳ ආයතන
3. බැංකු ආයතන
4. රක්ෂණ ආයතන
5. අධ්‍යාපන ආයතන **(ලකුණු 02)**

iv. සේවකයන් - 1. රැකියා සුරක්ෂිතතාවය 2. සාධාරණ වැටුපක් ලැබීම **(ලකුණු 01)**

රජය - 1. දේශීය නිෂ්පාදිතය ඉහළ දැමීම. 2. බදු අය කර ගැනීම. **(ලකුණු 01)**

**(මුළු ලකුණු 2x4=08)**

03. i. ශක්තීන් , දුර්වලතා, අවස්ථා, තර්ජන **(ලකුණු 02)**

ii. (අ) නීතිමය පරිසරය ආ) ආර්ථික පරිසරය
(ඇ) තාක්ෂණ පරිසරය (ඉ) ගෝලීය පරිසරය **(ලකුණු 02)**

iii.
1. සමාගම් රෙජිස්ටාර්
2. මධ්‍යම පරිසර අධිකාරිය
3. පාරිභෝගික සේවා අධිකාරිය
4. මහජන සෞඛ්‍ය පරීක්ෂක **(ලකුණු 02)**

iv.
1. අත් යන්ත්‍ර වෙනුවට නවීන යන්ත්‍ර භාවිතය
2. සාමාන්‍ය තැපැල වෙනුවට E - mail භාවිතය
3. ගිණුම්කරණ පොත් වෙනුවට ගිණුම්කරණ මෘදුකාංග භාවිතය
4. මාර්ගගත (Online) චැනල් සේවා ආරම්භය
5. E - Commerce භාවිතය **(ලකුණු 02)**

**(මුළු ලකුණු 2x4=08)**

04. i.

ව්‍යාපාර සංවිධානය
- ලාභ අරමුණු කර ගත්
  - පෞද්ගලික
    - තනි පුද්ගල ව්‍යාපාර
    - හවුල් ව්‍යාපාර
    - සංස්ථාපිත සමාගම්
  - රාජ්‍ය
    - රාජ්‍ය සමාගම්
- ලාභ අරමුණු කර නොගත්
  - පෞද්ගලික
    - සමූපාකාර සමිති
    - සමිති
  - රාජ්‍ය
    - රාජ්‍ය සංස්ථා
    - දෙපාර්තමේන්තු

**(ලකුණු 02)**

ii. (අ) සත්‍යයි (ආ) අසත්‍යයි
(ඇ) සත්‍යයයි (ඈ) අසත්‍යයි **(ලකුණු 02)**

iii. වාසි - විශාල ප්‍රාග්ධනයක් රැස් කිරීම.
නීතිමය පුද්ගලභාවය.
අඛණ්ඩ පැවැත්ම.
වගකීම සීමිත වීම.

අවාසි - නීතිමය බලපෑම වැඩි වීම.
ආරම්භය පහසු නොවීම. **(ලකුණු 02)**

iv. (අ) රාජ්‍ය සංස්ථා (ආ) කේවල ව්‍යාපාර
(ඇ) හවුල් ව්‍යාපාර (ඈ) සීමා සහිත සමාගම් **(ලකුණු 02)**

**(මුළු ලකුණු 2x4=08)**

## II කොටස - ගිණුම්කරණය

05. i. ඇල්මැති පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීමේ ක්‍රියාවලිය වේ **(ලකුණු 01)**

අරමුණු :-
1. ලාභය හෝ අලාභය ගණනය කිරීම.
2. නීතිමය අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
3. වැරදි හා වංචා අවම කිරීම. **(ලකුණු 01)**

ii. රු. 5 000 ක භාණ්ඩ තොගයක් විනාශ වීම.
රු. 3 000 ක ණයගැතියෙකු බන්කොලොත් වීම. **(ලකුණු 02)**

iii. (රුපියල්)

| | වත්කම් = | හිමිකම් + | වගකීම් |
|---|---|---|---|
| | 250 000 | 200 000 | + 50 000 (බැංකු ණය) |
| (අ) | - 20 000 (මුදල්)<br>+ 20 000 (තොග) | | |
| (ආ) | - 5 000 (තොග)<br>+ 6 500 (මුදල්) | + 1 500 (ලාභය) | |
| (ඉ) | - 3 000 (මුදල්) | - 3 000 (විදුලිය) | |
| (ඊ) | - 10 000 (මුදල්) | | - 10 000 (බැංකු ණය) |

**(ලකුණු 04)**

iv.

| ගිණුම | වැඩි වීම | අඩු වීම |
|---|---|---|
| (1) විකුණුම් ගිණුම | බැර | හර |
| (2) යන්ත්‍ර ගිණුම | හර | බැර |
| (3) ප්‍රාග්ධන ගිණුම | බැර | හර |
| (4) ලිපිද්‍රව්‍ය ගිණුම | හර | බැර |

**(ලකුණු $\frac{1}{2}$x8=4)**
**(මුළු ලකුණු 12)**

06. i. මූලික පොතක් ලෙස ක්‍රියා කිරීම හා ගිණුමක් ලෙස ක්‍රියා කිරීම. **(ලකුණු 02)**

ii. සුළු මුදල් භාරකරු සුළු මුදල් වියදම් කළ වටිනාකමට සමාන මුදලක් ප්‍රධාන මුදල්කරු ලබා දී අග්‍රිමය නැවත සකස් කිරීම. **(ලකුණු 02)**

iii. ධනුකගේ ව්‍යාපාරය
2020/01/01 දිනට
මුදල් පොත (රුපියල්)

| දිනය | ල/අ | විස්තරය | ස/පි | වටිනාකම | දිනය | ව/අ | විස්තරය | ස/පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| 20.01.01 | 01 | ප්‍රාග්ධනය | | 75 000 | | | | | |
| 20.01.04 | 02 | විකුණුම් | | 20 000 | 20.01.02 | 01 | ගැනුම් | | 25 000 |
| 20.01.08 | 03 | කොමිස් ආදායම් | | 10 000 | 20.01.06 | 02 | ගොඩනැගිලි කුලී | | 3 000 |
| 20.01.13 | 04 | බැංකු ණය | | 50 000 | 20.01.15 | 03 | යන්ත්‍ර | | 8 000 |
| | | | | | 20.01.25 | 04 | බැංකු ණය | | 5 000 |
| | | | | | 20.01.31 | | ශේ/ප/ගෙ | | 114 000 |
| | | | | 155 000 | | | | | 155 000 |
| 20.02.01 | | ශේ/ඉ/ගෙ | | 114 000 | | | | | |

**(නිවැරදිව මුදල් පොත සකස් කර තුලනයට ලකුණු 04)**

iv.

| | මූලාශ්‍ර ලේඛණය | මූලික පොත |
|---|---|---|
| (1) | ලදුපත්, වවුචර්පත් | මුදල් පොත |
| (2) | තැන්පතු පත්‍රය, පිළිපත, බැංකු ප්‍රකාශය | බැංකු ගිණුම |
| (3) | ගැනුම් ඉන්වොයිසිය | ගැනුම් ජ'නලය |
| (4) | විකුණුම් ඉන්වොයිසිය | විකුණුම් ජ'නලය |

**(ලකුණු $\frac{1}{2}$x8=4)**
**(මුළු ලකුණු 12)**

07. i. (අ)

නදීකගේ ව්‍යාපාරය
2020.01.31 දිනට
සංශෝධිත බැංකු ගිණුම (රුපියල්)

| දිනය | විස්තරය | වටිනාකම | දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|---|
| 20.01.31 | ශේ/ඉ/ගෙ | 25 000 | | බැංකු ගාස්තු | 3 000 |
| | ඍජු ප්‍රේෂණ | 15 000 | | ශේ/ප/ගෙ | 37 000 |
| | | 40 000 | | | 40 000 |
| | ශේ/ඉ/ගෙ | 37 000 | | | |

**( $\frac{1}{2}$ බැගින් ගිණුමෙහි කරුණු හතරකට ලකුණු 02)**

(ආ)

නදීකගේ ව්‍යාපාරය
2020.01.31 දිනට $\frac{1}{2}$
බැංකු සැසඳුම් ප්‍රකාශය

| | රු. | රු. | |
|---|---|---|---|
| සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය $\frac{1}{2}$ | | 37 000 | $\frac{1}{2}$ |
| + ඉදිරිපත් නොවූ චෙක්පත් | 20 000 | 20 000 | $\frac{1}{2}$ |
| | | 57 000 | $\frac{1}{2}$ |
| - උපලබ්ධි නොවූ චෙක්පත් | | 28 000 | $\frac{1}{2}$ |
| 2020.01.31 බැංකු ප්‍රකාශයට අනුව ශේෂය $\frac{1}{2}$ | | 28 000 | $\frac{1}{2}$ |

**(ලකුණු $\frac{1}{2}$x8=4)**

ii.

පබාගේ ව්‍යාපාරය
2020 ජනවාරි මාසය සඳහා
ගැනුම් ජ'නලය (රුපියල්)

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | වටිනාකම | ලෙ/පි |
|---|---|---|---|---|
| 2020.01.05 | 85 | ගයාන් | රු. 25 000 | |
| 2020.01.15 | 112 | සම්පත් | රු. 37 000 | |
| | | ගැනුම් ගිණුමට මාරු කළා | රු. 62 000 | |

**(ලකුණු $\frac{1}{2}$x4=2)**

iii. (අ) පොදු ජ'නලය

| විස්තරය | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| දුරකථන ගිණුම හර<br>අවිනිශ්චිත ගිණුම<br>(රු. 2 000 ක දුරකථන ගෙවීම් මුදල් පොතේ පමණක් සටහන් වීම නිවැරදි කිරීම.) | 2 000 | 2 000 |
| ණයගැති ගිණුම හර<br>විකුණුම් ගිණුම<br>(රු. 10 000 විකුණුම් ඉන්වොයිසිය මගහැරීම නිවැරදි කිරීම.) | 10 000 | 10 000 |
| යන්ත්‍ර ගිණුම හර<br>ගැනුම් ගිණුම<br>(රු. 5 000 යන්ත්‍ර මිලදී ගැනීම්, ගැනුම් ගිණුමට හර කර තිබීම නිවැරදි කිරීම.) | 5 000 | 5 000 |
| වැටුප් ගිණුම හර<br>අවිනිශ්චිත ගිණුම<br>(රු. 8 800 ක වැටුප් ගෙවීම් රු. 800 ලෙස එම ගිණුමේ සටහන් වීම නිවැරදි කිරීම.) | 8 000 | 8 000 |

**(ලකුණු $\frac{1}{2}$x4=2)**

(ආ) අවිනිශ්චිත ගිණුම (රු.)

| | | | | |
|---|---|---|---|---|
| ශේෂ පිරික්සුමේ වෙනස | 10 000 | දුරකථන | 2 000 | **(ල. 01)** |
| | | වැටුප් | 8 000 | **(ල. 01)** |
| | 10 000 | | 10 000 | |

**(ලකුණු 02)**

**(මුළු ලකුණු 12)**